# වැවිලි අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා තේ මණ්ඩලය

# තනතුරු පුරප්පාඩු

ශ්‍රී ලංකා තේ කර්මාන්තයේ නියාමන, සංවර්ධන සහ අලෙවි ප්‍රවර්ධන කටයුතු ඉටුකිරීම සඳහා ක්‍රියාත්මක වන ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව තුළ පවතින තේ උපදේශක / පරීක්ෂක තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් ලත් කාර්යශීලී, උද්‍යෝගිමත් හා විචක්ෂණශීලී ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## තේ උපදේශක / පරීක්ෂක තනතුරු III ශ්‍රේණිය (MA 2-1)

**රැකියා පිරිවිතරය :**

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ බලය ලත් නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ සංවර්ධන හා නියාමන ක්‍රියාකාරකම් ඉටුකිරීම සඳහා ලියාපදිංචි තේ නිෂ්පාදකයින්, ලියාපදිංචි අමු තේ දළු වෙළඳුන්, තේ ඇසුරුම්කරුවන් හා තේ ගබඩා අධීක්ෂණය / පරීක්ෂාව හා තේ අපනයනයකරුවන් පරීක්ෂාව හා අධීක්ෂණය.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද**

අ.පො.ස. (උ.පෙ) විභාගයෙන් විද්‍යා විෂය ධාරාවෙන් එක් වරකදී විෂයයන් තුනකින් සමත්වීම සහ අ.පො.ස. (සා.පෙ) විභාගයෙන් ගණිතය, ඉංග්‍රීසි සහ සිංහල / දෙමළ විෂයයන්ද ඇතුළුව සම්මාන 05 ක් සහිතව එකවර සමත් වී තිබීම

සහ

ශ්‍රී ලංකා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් කෘෂිකර්මය පිළිබඳ NVQ 05 මට්ටමට නොඅඩු සුදුසුකමක් ලබා තිබීම.

**වැටුප් පරිමාණය**

MA 2-1 රු. (30,310-10 x රු. 300-7 x රු. 350-4 x රු. 495-20 x රු. 660-50,940/-)

මූලික වැටුප රු. 30,310/- ක් හා ජීවන වියදම් දීමනාව වශයෙන් රු. 7,800/- ක් ගෙවනු ලැබේ.

**වයස් සීමාව :** අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.

**තෝරා ගැනීම**

ලිඛිත විභාගයකින් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

ලිඛිත පරීක්ෂණය සඳහා විෂයන් සහ ලකුණු ලබාදීමේ ක්‍රමවේදය

| | විෂය | කාලය හා ලකුණු | විභාග මාධ්‍යය |
|---|---|---|---|
| ● | භාෂා හැකියාව | (ලකුණු - 100) (පැය - 1 1/2) | ඉංග්‍රීසි හා සිංහල භාෂාව |
| ● | යෝග්‍යතා පරීක්ෂණය | (ලකුණු - 100) (විනාඩි - 45) | සිංහල හෝ දමිල භාෂාව |
| ● | තනතුරට අදාළ විෂය දැනුම | (ලකුණු - 100) (පැය - 03) | සිංහල හෝ දමිල භාෂාව |

ලිඛිත විභාගය සමත්වීම සඳහා එක් විෂයකට අවම වශයෙන් 40% ක් ලකුණු ලබා තිබීම සහ සමස්ත විභාගයෙන් 50% ක සාමාන්‍යයක් ලබා තිබීම අවශ්‍යය.

**පොදු කොන්දේසි**

- සියලු අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- සියලු අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත මනා සෞඛ්‍ය තත්ත්වයකින් පරිපූර්ණ විය යුතුය.
- සියලුම අයදුම්කරුවන් මනා චරිතයකින් හෙබි පුද්ගලයින් විය යුතුය.
- තෝරා ගනු ලබන බාහිර අයදුම්කරුවන් වසර 03 ක පරිවාස කාලයකට යටත්ව බඳවා ගනු ලබන අතර, තනතුරෙහි ස්ථිර කරන ලද අභ්‍යන්තර අයදුම්කරුවන් වසරක පරීක්ෂණ කාලයකට යටත්ව පත්කිරීම සිදු කරනු ලැබේ.
- සියලු තෝරා ගනු ලබන බාහිර අයදුම්කරුවන් අදාළ වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් තලයේ පිහිටවන අතර, අභ්‍යන්තර අයදුම්කරුවන්ගේ වැටුප ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයෙහි 04 ඡේදය ප්‍රකාරව පිහිටුවනු ලැබේ.

**වෙනත් ප්‍රතිලාභ**

- මණ්ඩලයේ දැනට පවතින නීතිරීතිවලට අනුකූලව වෛද්‍ය සහනාධාර පහසුකම් ලබාදෙනු ඇත.
- තෝරාගනු ලබන අයදුම්කරුවන් ඔහුගේ / ඇයගේ වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සඳහා ගෙවිය යුතු අතර, මණ්ඩලය ඒ සඳහා 15% කින් දායක වනු ඇත.
- මණ්ඩලය තවදුරටත් සේවා නියුක්ත භාර අරමුදලට ඔහුගේ / ඇයගේ වැටුපෙන් 3% කින් දායක වනු ඇත.

**අයදුම් කිරීම**

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශය ද සහිතව තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

මෙම කාර්යාලයෙන් හෝ www.srilankateaboard.com වෙබ් අඩවියෙන් ලබාගත් නියමිත ආකෘති පත්‍රය පරිදි සකස් කරන ලද අයදුම්පත් උප්පැන්න සහතිකයේ සහ සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමග 2021 මාර්තු 31 වන දිනට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලි.ප.තැ එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා තේ මණ්ඩලය,**
**574, ගාලු පාර. කොළඹ 03.**